# අපට වෙච්ච දේ හා ඉන් ගොඩ ඒම - II

ඕල්කට් තුමාට පෙර මෙරට සිංහල බෞද්ධකමක් තිබිණි දැයි අද ඉන්නා ප්‍රබුද්ධයකු ඇසීමට ඉඩ ඇත. ගැමුණු රජු සමයේ සිදු වූ රූපාන්තරකරණයත් සමග මෙරට ඇතිවූයේ සිංහල බුද්ධාගම ය. අවශ්‍ය නම් එයට සිංහල ථෙරවාද බුද්ධාගම (බුදු සසුන) යැයි කිව හැකි ය. අනගාරික ධර්මපාල තුමාට ඕල්කට් තුමාගේ ව්‍යාපාරය නිසා සිංහල බුද්ධාගම නැති වී ඊනියා ජාත්‍යන්තර බුද්ධාගමක් මෙරට ඇති වීමට යන්නේ ය යන අදහස සිතෙහි ඇතිවන්නට ඇතැයි සිතිය හැකි ය. එතුමා සිංහල බෞද්ධයන් ගැන කතා කෙළේ එබැවින් විය යුතු ය. සිංහල බුද්ධාගම යන්න ඇතැමුන් කියන පරිදි ධර්මපාලතුමා ඇති කරන ලද්දක් නොවේ. එතුමා විසින් කරන ලද්දේ ගැමුණු රජ දවස සිට පැවති ප්‍රපංචයකට නමක් දීම පමණකි. සිංහල බුද්ධාගම ඇති කෙළේ ගැමුණු රජු මිස ධර්මපාල තුමා නොවේ.

ඕල්කට් බුද්ධාගම යනුවෙන් හැඳින්වෙන්නේ කුමක් ද යන්න තරමක් හෝ පැහැදිලි කළ යුතු ය. ඇතැම් බටහිර සමාජ විද්‍යාඥයෝ ප්‍රොතෙස්තන්ත බුද්ධාගමක් ගැන කතා කරති. එහි දී ඔවුන්ට වඩා වැදගත්වන්නේ ප්‍රොතෙස්තන්ත ක්‍රිස්තියානිය ඇසුරෙන් දහනම වැනි සියවසර අග හා විසිවැනි සියවසර මුල මෙරට බුද්ධාගමට එකතු වූ දෑය. නත්තල් සුබ පැතුම් ඇසුරෙන් වෙසක් සුබ පැතුම් ඇති කිරීම, ක්‍රිස්තියානි කැරොල් ආභාසයෙන් භක්ති ගී (කලකට පෙර භක්ති ගී හැඳින්වුණේ ද කැරොල් නමිනි.) නිර්මාණය කිරීම, ක්‍රිස්තියානි ඉරිදා පාසල් අනුගමනය කරමින් බෞද්ධ ඉරිදා පාසල් (අද දහම් පාසල් නමින් හැඳින්වෙයි.) පැවැත්වීම, පොල්තෙල් පහන වෙනුවට ඉටිපන්දම සහිත බක්ට්ටුව ආදේශ වීම ආදිය මෙහි දී වැදගත් වෙයි. මේ සිංහල බෞද්ධ සංස්කෘතිය තුළට එක් වූ දෑය. සිංහල බුද්ධාගම හෝ වෙනත් බුද්ධාගමක් යනුවෙන් ආගමක් පමණක් නොව සංස්කෘතියක් ද හැඳින්වෙයි. ඕල්කට්තුමා පැමිණීමෙන් පසුව සිංහල බෞද්ධ සංස්කෘතියෙහි පමණක් නොව ආගමක් ලෙස ගත්කළ සිංහල බුද්ධාගමෙහි ද වෙනසක් සිදු විය. මේ වෙනස්වීම්වලින් පසුව ඇති වූ ආගම හා සංස්කෘතිය අපි පිළිවෙළින් ඕල්කට් බුද්ධාගම හා ඕල්කට් බෞද්ධ සංස්කෘතිය ලෙස හඳුන්වමු. ඇතැම් විටෙක ඕල්කට් බුද්ධාගම යනුවෙන් ඕල්කට් බෞද්ධ සංස්කෘතිය ද හැඳින්වෙයි. සංදර්භය අනුව ඕල්කට් බුද්ධාගම යනුවෙන් කියැවෙන්නේ සංස්කෘතිය ද ආගම ද යන්න තීරණය කිරීම අපහසුවක් නොවනු ඇත.

ඕල්කට්තුමා ලංකාවට පැමිණීමට පෙර පරම විඥානාර්ථවාදියෙක් විය. පරම විඥානාර්ථවාදය යනු හින්දු වාදයක් මිස බෞද්ධ වූවක් නොවේ. බෞද්ධ පරම විඥානාර්ථවාදය යන්න ඕල්කට්තුමා හා එකල පැමිණි අනෙක් පරම විඥානාර්ථවාදීන් නිසා ඇති වූවක් විය. ඕල්කට්තුමා පැමිණීමට පෙර බෞද්ධ පරම විඥානාර්ථවාදයක් නොවී ය. ඈත අතීතයේ භාරතයේ බෞද්ධ විඥානවාදයක් තිබූ නමුත් එය පරම විඥානාර්ථවාදයක් නොවී ය. පරම විඥානාර්ථවාදය පමණක් නොව වසුබන්ධු අසංග ස්වාමීන්වහන්සේලාගේ ආලය විඥානය වස්තු කරගත් (එය වස්තුවක් මිස අනෙකක් නොවේ) ඒ විඥානවාදය ද ආත්මවාදයක් විය. පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ ඇතැම්හු කලක් මේ විඥානවාදය ඊනියා උගතුන් අතර ප්‍රචලිත කිරීම සඳහා වැයමක් දැරූහ. එපමණක් නොව ආලය විඥානය පදනම් කර ගත් වැල් වටාරම් ඊනියා නව රීතියක නවකතා ලෙස හඳුන්වා දීමේ ව්‍යාපාරයක් ද වෙයි. මේ සියල්ල නිර්මාණ නොව හුදු අනුකරණ පමණක් වෙයි. වෙනත් සංස්කෘතියක ඇති දෙයක් නිර්මාණාත්මක ව අපේ සංස්කෘතිය තුළට ගැනීම වරදක් නොවේ. යමක් අපට අවශ්‍ය නම් එසේ ගැනීමට අනුබලය දිය යුතු ය. එහෙත් ඊනියා ශාස්ත්‍රීය ක්ෂේත්‍රවල කෙරෙන අනුකරණ යනු නිර්මාණාත්මක හැකියාවක් නොමැති පුද්ගලයන් තම සංස්කෘතිය තුළ වෙනස් පුද්ගලයන් ලෙස කැපී පෙනී සිටිමින් පොරවල් බවට පත්වීම සඳහා කරන ව්‍යායාමවල ප්‍රතිඵල පමණකි. තම සංස්කෘතිය තුළ රැඳෙමින් තම අනන්‍යතාවය තහවුරු කර ගැනීමට තරම් හැකියාවක් මොවුන්ට නැත.

බටහිර සිට පැමිණි කලක් එක දේවවාදී ආගමක් ඇදහූවනට පරම විඥානාර්ථවාදය සුදුසු දහමක් විය. එක දේවවාදයෙන් පරම විඥානාර්ථවාදයට මාරු වීම එතරම් අපහසු කාරයයක් නොවී ය. බ්ලැවට්ස්කි මැතිණිය, රීස් ඩේවිස් මහතා සහ මහත්මිය ආදී සියළු දෙනාට ථෙරවාදය එතරම් ප්‍රියජනක දහමක් නොවී ය. අනාත්මය හා අනිත්‍යය බටහිර මනසකට එතරම් පහසුවෙන් ගෝචර වන දෑ නොවේ. (කිනම් මනසකට වුව ද අනාත්මය හා අනිත්‍යය එතරම් ආකර්ශනීය විය නොහැකි ය. මනස ද අනාත්ම හා අනිත්‍ය යැයි කියන විට මනස එය දරා ගන්නේ කෙසේ ද? මනස එයට එකඟ වන්නේ කෙසේ ද?) පරමාත්මය, පරම විඥානය ආදිය බටහිර මනසට වඩා සමීප ය.

© Prof. Nalin De Silva

ඕල්කට්තුමා ආදීන්ගේ අනුග්‍රහයෙන් ආනන්ද විද්‍යාලය ඇතුළු බෞද්ධ ඉංගිරිසි පාසල්වල බුද්ධාගම නමින් ඉගැන් වූ පරම විඥානාර්ථවාදය පිළිබඳ ව ඇල්. එච්. මෙත්තානන්ද මහතා ප්‍රසිද්ධියේ ම තම නොසතුට පළ කර ඇත.

ඕල්කට්තුමා අප රට තුළ ප්‍රචලිත කෙළේ පරම විඥානාර්ථවාදය පමණක් නොවේ. එතුමා සිංහල බුද්ධාගම ඊනියා ජාත්‍යන්තර  බුද්ධාගමක් බවට ද පත් කිරීමට කටයුතු කෙළේ ය. වෙනත් වචනවලින් කියන්නේ නම් ගැමුණු රජතුමා හඳුන්වා දුන් සිංහල බුද්ධාගමෙහි සිංහල යන්න නැති වීම ඕල්කට් තුමාගේ ව්‍යාපාරයෙහි ප්‍රතිඵලයක් විය. මෙය විවිධ ක්‍රිස්තියානි ධර්මවලින් එතුමා දැන සිටි කරුණක් විය. රෝමානු කතෝලික, ඇංග්ලිකන්, මැතෝදිස්ත ආදී විවිධ ක්‍රිස්තියානි සභා තිබුණ ද ඒ එක එකක් මුළු ලෝකයට ම පොදු විය. රෝමානු කතෝලික ආගමේ ප්‍රධානියා පාප්තුමා විය. මුළු ලෝකයට ම රෝමානු කතෝලික ආගම සම්බන්ධයෙන් බලපාන තීන්දු ගනු ලැබුයේ වතිකානුවෙනි. රෝමයේ සිටිය ද, ලංඩනයේ සිටිය ද, ගෝවේ සිටිය ද, මීගමුවේ සිටිය ද කතෝලික බැතිමතා රෝමානු කතෝලික බැතිමතෙක් විය. මුළු ලෝකයට ම ඇත්තේ එකම රෝමානු කතෝලික ආගමකි. එය ජාත්‍යන්තර ආගමකි. සිංහල රෝමානු කතෝලික ආගම යනුවෙන් ආගමක් නොවේ. ඇංග්ලිකන් ක්‍රිස්තියානිය ගත්ත ද තත්ත්වය එසේම ය. කැන්ටබරියේ ආච් බිෂොප්තුමා ඒ ආගමෙහි ප්‍රධාන පූජක තැන වෙයි. එහි ප්‍රධානියා එංගලන්තයේ රැජන ය. සිංහල ඇංග්ලිකන් ආගමක් යනුවෙන් ආගමක් නොවේ. ඇත්තේ ජාත්‍යන්තර ඇංග්ලිකන් ආගමකි. ඕල්කට් තුමා ආදීනට තිබුණේ ආගම් සම්බන්ධයෙන් ගත්කල එවැනි අත්දැකීමකි. මේ අත්දැකීම උඩ පිහිටා, එනම් බටහිරට සාපේක්ෂව, ලෝකය දෙස බැලීමේ ප්‍රතිඵලය වූයේ සිංහල බුද්ධාගමේ සිංහල යන්න මැකී යෑම ය.

ඕල්කට්තුමාට බලපෑ තවත් කරුණක් විය. රෝමානු කතෝලික ආගම 15 වැනි සියවසේ පමණ සිට අර්බුදයකට මුහුණ පෑවේ ය. රෝමානු කතෝලික ආගම හා ඒ හා බැඳුණු සංස්කෘතිය යුරෝපයේ දී (රෝම අධිරාජ්‍යය තුළ) කිනම් වෙනස්කම්වලට භාජනය වී තිබුණ ද මූලික වශයෙන් ගත්කල ආසියාතික ආගමක් හා සංස්කෘතියක් විය. එහි සමස්තය යන්න වැදගත් සංකල්පයක් විය. කතෝලික යන වචනයේ අර්ථය ද සමස්තය යන්න වෙයි. වතිකානුවේ සාන්ත පීතර පල්ලියේ අත් දෙකක හැඩයට පරාවලයක ආකාර සුප්‍රසිද්ධ නිර්මාණයක් ඇත්තේ ද මේ සමස්තය නිරූපණය කිරීමට යැයි කියැවෙයි. රෝමානු කතෝලික ආගම විශ්ලේෂණයට වඩා සංස්ලේෂණයට තැනක් දෙයි. කතෝලික ආගමේ ඇත්තේ ත්‍රිකෝටික න්‍යායකි. මේ න්‍යාය (ලොජික් යන අරුතින්) හින්දු ආගමේ න්‍යායෙන් වෙනස් නොවේ. දෙවියන් වහන්සේගේ පුත්‍රයා වූ ක්‍රිස්තුස් වහන්සේ දෙවියන් වහන්සේ ම වන්නේ මේ ත්‍රිකෝටික න්‍යායට අනුව ය. විෂ්ණු දෙවියන්ගේ අවතාර වරින් වර ලෝකයට ඒමට හැක්කේ ද මේ න්‍යායට අනුව ය. 15 වැනි සියවස පමණ වන විට යුරෝපය රෝමානු කතෝලික ආගමට විරුද්ධව කැරලි ගසන්නට පටන් ගත්තේ ය. එය ආරම්භ වූයේ ම ඉතාලියෙහි හා ඒ අවට රටවල ය! මේ කැරැල්ල යනු අන් කිසිවක් නොව යුරෝපය, යුරෝපය බවට පත්වීමේ කැරැල්ල ය. වැඩවසම් යුගයේ අවසානය, ධනපති ක්‍රමයේ නැගීම, නූතනත්වයේ ආරම්භය, බටහිර විද්‍යාව පැන නැගීම ආදී වශයෙන් කිනම් ආකාරයකට හැඳින්වුව ද, මෙහි දී සිදු වූයේ චින්තන විප්ලවයක් ආරම්භ වීම ය. ඉතිහාසයේ සරදමකට මෙන් කැරැල්ල මතුවීමට ප්‍රධාන හේතුව වූයේ ආසියාවේ නිර්මාණය කර තිබූ දැනුම අරාබීන් හරහා යුරෝපයට යෑම ය. මේ පිළිබඳ දීර්ඝ විස්තරයක් කළ යුතු නමුදු මේ ඒ සඳහා අවස්ථාව නොවේ. (අපේ ප්‍රවාද ලිපි පෙළෙහි මේ කරුණු සාකච්ඡා වෙයි.)   කෙසේ හෝ ශත වර්ෂ කිහිපයක් තුළ පැතිර ගිය මේ චින්තන විප්ලවයෙහි ප්‍රතිඵලයක් ලෙස සංස්ලේෂණය වෙනුවට විශ්ලේෂණය ඉදිරියට පැමිණියේ ය. ත්‍රිකෝටික න්‍යාය අත්හැර යුරෝපීයයෝ ඇරිස්ටෝටල්ගේ ද්විකෝටික න්‍යාය වෙත ආපසු ගියහ. රෝමානු කතෝලික ආගම වියුක්තයට (ඇබ්ස්ට්‍රැක්ට්) වඩා සංයුක්තය (කොන්ක්‍රීට්) ප්‍රිය කළ ද දැන් වියුක්තයට එතෙක් නොතිබූ තැනක් ලැබුණි. එහෙත් රෝමානු කතෝලික චින්තනය යුදෙව් චින්තනය ඔස්සේ ඒ වන විට ඉතා වැදගත් දෙයක් යුරෝපීය චින්තනයට එක් කර තිබුණි. ඒ අන් කිසිවක් නොව ප්‍රථම හේතුව පිළිබඳ මතවාදය හා එක දේව වාදය පිළිබඳ සංකල්පය ය. (මතු සම්බන්ධයි)

***සටහන:*** මේ ලිපි පෙළෙහි පළමු ලිපියෙහි කැප්පෙටිපොළ දිසාව බ්‍රිතානි හමුදාවට එකතු වී යැයි සඳහන් වී තිබුණේ වැරදීමකිනි. එතුමා බ්‍රිතානි හමුදාවට එකතු නොවූ බව මා හිතවත් මහාචාර්යවරයෙක් පෙන්වා දෙයි. කැප්පෙටිපොළ දිසාවට බ්‍රිතානි හමුදාව සමග යෑමට සිදුවූයේ එතුමා ඌවේ දිසාව වූ නිසා ය. වරද ගැන කණගාටුවන අතර ඒ පෙන්වා දුන් මිතුරාට මගේ ස්තුතිය පිරිනැමෙයි.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva